# ඇමරිකන් එක්ස්ප්‍රස් SMS සේවාව

අපගේ කාඩ්පත් හිමි පාරිභෝගිකයින්ට පහසුව සහ ආරක්ෂාව සලසා දීම අපගේ වගකීම බව ඇමරිකන් එක්ස්ප්‍රස් වශයෙන් අපි විශ්වාස කරන්නෙමු.

ඇමරිකන් එක්ස්ප්‍රස් SMS සේවාව සඳහා ලියාපදිංචි වී ඔබේ කාඩ්පතෙන් සිදු කෙරෙන සියලුම ගනුදෙනු පිළිබඳ විස්තර SMS මගින් ඔබේ ජංගම දුරකතනයට ලබාගන්න. එසේම ඔබට ඔබේ කාඩ්පතේ ශේෂය සහ සාරාංශ ප්‍රකාශන ද එමගින් ලබාගත හැකියි.

4 414141 අමතා අදම ලියාපදිංචි වන්න

**ඔබ ඇමරිකන් එක්ස්ප්‍රස්** SMS **සේවාව සඳහා ලියාපදිංචි වූ පසු:**

- ඔබේ කාඩ්පතෙන් ගනුදෙනු සිදුවන සෑම අවස්ථාවකදීම එය ඔබට දැනුම් දෙමින් SMS පණිවිඩයක් ලැබේ
- ඔබේ කාඩ්පත් ගිණුමේ ශේෂය දැනගැනීමට අවශ්‍ය නම් BAL<හිස්තැනක්>කාඩ්පත් ගිණුම් අංකය ටයිප් කර 0114682767ට SMS කරන්න
- ඔබේ කාඩ්පතේ සාරාංශ ගිණුම් ප්‍රකාශනයක් ලබාගැනීමට අවශ්‍ය නම් SBAL<හිස්තැනක්>කාඩ්පත් ගිණුම් අංකය ටයිප් කර 0114682767ට SMS කරන්න

**නියමයන් සහ කොන්දේසි**

හිතවත් මහත්මයාණෙනි

......................... අංකය දරන ජාතික හැඳුනුම්පත හිමි ............................. වන මම නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ (PLC) (මින් මතු “බැංකුව” ලෙසින් හැඳින්වේ) SMS බැංකු සේවා සහ/හෝ ජංගම දුරකතන බැංකු සේවා (මින් මතු “නේෂන්ස් SMS සහ ජංගම දුරකතන බැංකු සේවා” ලෙස හැඳින්වේ) මා වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබාදෙමින් ඒ සඳහා ඉල්ලුම් කර සිටින අතර පහත සඳහන් නියමයන් සහ කොන්දේසිවලට එකඟවන බව ප්‍රකාශ කර සිටිමි:

1. නේෂන්ස් SMS සහ ජංගම දුරකතන බැංකු සේවා මාගේ පෞද්ගලික පරිහරණය සඳහා පමණක් භාවිතා කරමි

2. මම SMS බැංකු සේවාව සඳහා පමණක් ලියාපදිංචි වී ඇති අවස්ථාවක මාගේ සිම් කාඩ්පත නැතිවුවහොත් හෝ මාගේ ජංගම දුරකතන අංකය වෙනස් කළහොත් වහාම (011) 4711411 ඔස්සේ ඇමතුම් මධ්‍යස්ථානය අමතා ඒ පිළිබඳව බැංකුව දැනුවත් කරමි.

3. බැංකුව වෙත ලියාපදිංචි කර ඇති මාගේ ජංගම දුරකථනය සහ/හෝ සිම් කාඩ්පත නැතිවුවහොත් කිසියම් ගනුදෙනුවක් සිදුකිරීමට පෙර ඒ පිළිබඳව මා විසින් බැංකුව වෙත දැනුම්දීමක් කර නොමැති අවස්ථාවක, මා විසින් සිදු නොකරන ලද කිසියම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් නේෂන්ස් SMS බැංකු සේවාව ඔස්සේ ලබාදෙන කිසියම් තොරතුරක් හේතුවෙන් සිදුවන කිසිදු අලාභ, හානි, වියදම් හෝ සිදුවන අලාභ සම්බන්ධයෙන් බැංකුව වගකිවයුතු නොවන බවට සහ බැංකුව වෙත කිසිදු වගකීමක් නොපවරන බවට මෙයින් එකඟ වෙමි.

4. කිසියම් තාක්ෂණික දෝෂයක් හෝ ලියාපදිංචි ජංගම දුරකථනයේ කිසියම් දෝෂයක් සහ/හෝ කිසියම් හේතුවක් නිසා ජංගම දුරකතන සේවාව විසන්ධි කිරීම වැනි හේතු නිසා මාගේ මෙම සේවාව ස්වයංක්‍රීයව අක්‍රීය වුවහොත් ඒ සම්බන්ධයෙන් බැංකුව වගකිවයුතු නොවන බවට මෙයින් එකඟ වෙමි.

5. SMS බැංකු සේවාව සඳහා ලියාපදිංචි වූ පසු කාලයෙන් කාලයට බැංකුව දැනුම්දෙන පරිදි අදාළ නියමිත ආකෘතියට අනුව සියලුම SMS ඉල්ලීම් යොමු කිරීමට එකඟ වෙමි. මා විසින් යොමු කරන ආකෘතියට අනුකූල නොවන SMS ඉල්ලීම් පිළිබඳව බැංකුව උපදෙස් ලබා දෙන හෝ නොදෙන බව මා විසින් පිළිගනු ලබන අතර එවැනි උපදෙස් ලබාදීමට හෝ නොදීමට බැංකුව වගකිවයුතු නොවන බවට මම එකඟ වෙමි.

6 නේෂන්ස් SMS බැංකු සේවාව භාවිතා කිරීම සහ නීති ගාස්තු ඇතුළු වෙනත් බැඳුම්කර හෝ නේෂන්ස්ˆඒ බැංකු සේවාව භාවිතයට අදාළ වෙනත් ව්‍යවස්ථානුකූල ගාස්තු ඇත්නම් ඒ සියල්ල මාගේ බැංකු ගිණුමෙන් අය කරගැනීම සඳහා බැංකුවට බලය ඇති බවට එකඟ වෙමි.

7 ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්පත සම්බන්ධයෙන් නේෂන්ස් SMS බැංකු සේවාව භාවිතා කිරීම සහ නීති ගාස්තු ඇතුළු වෙනත් බැඳුම්කර හෝ නේෂන්ස් SMS සහ ජංගම දුරකථන බැංකු සේවාව භාවිතයට අදාළ වෙනත් ව්‍යවස්ථානුකූල ගාස්තු ඇත්නම් ඒ සියල්ල මාගේ ඇමරිකන් එක්ස්ප්‍රස් ගිණුමෙන් අය කරගැනීම සඳහා බැංකුවට බලය ඇති බවට එකඟ වෙමි.

8 මෙම සේවාව ලබාදීමට ඇති හැකියාව මත පදනම්ව ලබාදෙන බැවින් කිසියම් වේලාවක හෝ කාලයෙන් කාලයට සේවාව ලබාගැනීමේ හැකියාව නොමැති වීම හෝ සේවාවට බාධා සිදුවීම හේතුවෙන් සිදුවන අලාභ, හානි හෝ අපහසුතා සම්බන්ධයෙන් වගකිවයුතු නොවන බවට එකඟ වෙමි. එසේම දත්ත අස්ථානගත වීම හෝ සම්ප්‍රේෂණයේදී පණිවිඩයෙන් කොටසක් හෝ සම්පූර්ණ පණිවිඩය නැති වීම සහ/හෝ සම්ප්‍රේෂණය අතරතුර සිදුවන බාධාවක් හේතුවෙන් හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා මා විසින් යොමු කරන ලද තොරතුරු ඉල්ලුම් කිරීමේ පණිවිඩයකට ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වීම හේතුවෙන් සිදුවන අලාභ හෝ හානි සම්බන්ධයෙන් බැංකුව වගකිව යුතු නොවන බව ද මා දනිමි.

9 මා වෙත බැඳී ඇති ප්‍රකාශයට පත් කරන ලද නියමයන් සහ කොන්දේසි පූර්ව දැනුම්දීමකින් තොරව කාලයෙන් කාලයට සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ ඉවත් කිරීම හෝ සම්පූර්ණයෙන්ම වෙනත් නියමයන් සහ කොන්දේසි පැනවීමේ අයතිය බැංකුව සතු බව මෙයින් පිළිගනිමි. මෙම සේවාව තවදුරටත් ඉදිරියට භාවිතා කිරීමෙන් එවැනි වෙනස්කම්, සංශෝධන, එකතු කිරීම් හෝ නැවත පැනවීම්වලට එකඟ බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

10 මෙම සේවාව ශ්‍රී ලංකාවේ පවතින සියලු නීති රෙකුලාසිවලට සහ බැංකු ගනුදෙනු සඳහා අදාළ වෙනත් ස්ථාවර නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ලබා දේ. එබැවින් සාධාරණ හේතුවක් ඇති බවට බැංකුව විනිශ්චය කළහොත් මා විසින් ඉල්ලුම් කරන සේවාවන් ඕනෑම වේලාවක/වේලාවන්හිදී ඕනෑම ගනුදෙනු/ගනුදෙනුවක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ පවත්වාගෙන නොයාමේ අයිතිය බැංකුව සතුය. බැංකුව විනිශ්චය කළහොත් මාගේ සේවාවන් අත්හිටුවීමට හෝ නවතා දැමීමට හෝ වෙනත් දිශාවකට යොමු කිරීමට ද බැංකුවට අයිතිය ඇත.

11 මෙම ලිපියෙහි නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ක්‍රියා කිරීමට ඔබ එකඟවීම සලකා බලා, මාගේ ඉල්ලීම අනුව ක්‍රියා කරමින් සහ/හෝ සන්නිවේදනය කරමින් සෘජුව හෝ වක්‍රව, සබඳතා ඇතිව හෝ නොමැතිව නේෂන්ස්ˆඒ බැංකු සේවාව මා වෙත ලබාදෙමින් ඔබට එරෙහිව හෝ යටත්ව අලාභ හානි පිරිවැය සහ වියදම් හේතුවෙන් සිදුවන ක්‍රියාකාරකම්, පටිපාටීන්, හිමිකම් ලබාගැනීම්, අලාභ, හානි, පිරිවැය සහ වියදම් වලින් ආරක්ෂා කිරීමට සහ වන්දි පූරණය කිරීමට මා පොරොන්දු වෙමි

12 මා හා බැඳී ඇති නේෂන්ස් SMS බැංකු සේවාව භාවිතා කර සිදුකරන සියලු ගනුදෙනු සම්බන්ධ බැංකු වාර්තා සහ ප්‍රකාශන පිළිගනිමි.

13 නේෂන්ස් SMS බැංකු සේවාව යටතේ ඇති තුන්වන පාර්ශවයක් වෙත මුදල් මාරු කිරීම් කාලයෙන් කාලයට බැංකුව විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත් බව පිළිගනිමි.

14 බැංකුව සහ එහි සේවාවන් සම්බන්ධයෙන් හෝ බැංකුව අභිමත වෙනත් කරුණු සම්බන්ධයෙන් වන ප්‍රවර්ධන පණිවිඩ (SMS) වරින් වර මා වෙත ලැබෙන බව මම දනිමි. මා විසින් විශේෂයෙන් පණිවිඩ ලබා නොගැනීමට තීරණය කර ඇති අවස්ථාවකදී හැර මෙම සේවාව සඳහා ලියාපදිංචි වීමෙන් සහ එය භාවිතා කිරීමෙන් එවැනි පණිවිඩ ලැබීම සඳහා මා විසින් එකඟතාවය පළ කරනු ලැබේ.

15 නේෂන්ස් SMS බැංකු සේවාව භාවිතය හා සම්බන්ධ ප්‍රතිලාභ සම්බන්ධ තීරණ බැංකුව විසින් ගනු ලබන අතර සිය අභිමතය පරිදි කාලයෙන් කාලයට එම ප්‍රතිලාභ, සේවාවන් සහ කොන්දේසි වෙනස් කිරීම, ආපසු ගැනීම හෝ සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතුය.

16 සියලුම අය කිරීම්, ගාස්තු, දඩ මුදල් බැංකුවේ තනි අභිමතය පරිදි වෙනස් විය හැකි අතර එවැනි ගාස්තු හෝ අමතර අය කිරීම් පිළිබඳව ඇමතුමකින් හෝ ප්‍රකාශනයකින් හෝ ගාස්තු පිළිබඳ දැන්වීමකින් හෝ ශ්‍රී ලංකාවේ පලවන පුවත්පතකින් හෝ පුවත්පත් කිහිපයක් මගින් ඒ පිළිබඳව දැනුම් දෙනු ලැබේ. ගාස්තු සහ අය කිරීම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු මෙම සේවාවට අදාළ නම් බැංකුව මගින් ප්‍රකාශයට පත් කරන ගාස්තු පිළිබඳ අත්පොතෙහි ඒ පිළිබඳ සටහන් වන අතර ශ්‍රී ලංකාවේ ඕනෑම බැංකු ශාඛාවකින් එහි පිටපතක් ඉල්ලුම් කර ලබාගත හැක.

17 නේෂන්ස් SMS බැංකු සේවාව අත්හිටුවීමට මා හට අවශ්‍ය නම්, සේවාව අත්හිටුවන ලෙස ලිඛිත ඉල්ලීමක් දින 7කට පෙර බැංකුව වෙත ලබා දෙමි.

18 නේෂන්ස් SMS බැංකු සේවාව සම්බන්ධ කිසියම් ගැටලුවක් හෝ එහි ගනුදෙනු සම්බන්ධ අපැහැදිලිතාවයක් හෝ කිසියම් පැමිණිල්ලක් ඇත්නම් පහත ක්‍රමයන්ට අනුව මම බැංකුව අමතන්නෙමි :

| | |
|---|---|
| දුරකතන/ෆැක්ස් | (011) 4711411 / (011) 4414142 |
| ඊමේල් | customerservice@nationstrust.com |
| තැපැල් | ළගම බැංකු ශාඛාවේ කළමනාකරු වෙත ලිපිය යොමු කරන්න |

මා විසින් ඉල්ලුම් කරන ලද නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ (PLC) නේෂන්ස් SMS බැංකු සේවාවට අදාළ නියමයන් සහ කොන්දේසි වල පිටපතක් මා වෙත ලබාදුන් බවත් එය අත්සන් තැබීමට පෙර මා වෙත පැහැදිලි කරදුන් බවත් මෙයින් ප්‍රකාශ කර සිටින අතර එහි නියමයන් සහ කොන්දේසි මා හොඳින් කියවා අවබෝධ කරගත් බවත් ඊට එකඟ වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

........................................ ........................................

අත්සන දිනය

නේෂන්ස් ජංගම දුරකථන බැංකු සේවාව තෝරාගෙන ඇති පාරිභෝගිකයින් සඳහා පමණක් අදාළ වේ